# ඇරයුම

වෙළුම 1 කලාපය 1 ත්‍රෛ මාසිකය මිල 15/-

සෑම ජීවියෙකුම මරණයේ සුව
විඳිති. නුඹලා නුඹලාගේ පූර්ණ
ඵලවිපාක දෙනු ලබන්නේ
පරමාන්ත දිනයේදීය. යමෙක්
අපාය ගින්නෙන් මිදෙනු ලැබේ
නම් ඔහු සැබෑ ලෙසින්ම
සාර්ථකත්වය ලබන්නේය. මෙලොව
ජීවිතය මායා සුඛෝපභෝගයෙක්
මිස, නැත.
(අල් කුර්ආන් 3:185)

ප්‍රකාශනය හා බෙදා හැරීම
**ආගමික හා සංස්කෘතික අධ්‍යයන සංසදය(FRCS)**
**තැ.පෙ 1989, කොළඹ.**
**දු.අ: 0115 6 90717**

**සංස්කාරක මණ්ඩලය**

අෂ්ෂෙයික් ලෆරුල්ලාහ් (බහ්ජි)

අෂ්ෂෙයික් කලීල් (මදනි)

එම් අජ්මල් රෆීක්

කුර්ෂිඩ් අහමඩ්

ෂෙයික් රිස්වි ෆලීල්

මෙම සඟරාව සම්බන්ධයෙන් ඔබට ඇති අදහස් යෝජනා චෝදනා අපවෙත ලියා එවන්න. ඔබට ඉස්ලාම් දහම සම්බන්ධයෙන් නොමිලේ තොරතුරු, පොත්පත් අවශ්‍ය වන්නේ නම් අපහා සම්බන්ධ වන්න. එසේම ඉස්ලාම් දහමෙන් ඔබට ප්‍රශ්න තිබේ නම් අපට දුරකථනය ඔස්සේ අමතන්න. එයට පිළිතුරු දීම සඳහා අප ඇපකැප වී සිටින්නෙමු. සතියේ දිනවල ප.ව 12.00 සිට ප.ව 1.00 පහත සඳහන් දුරකථන අංකය විවෘත ඇත.

**දු.අ: 0115 690717**

**ISSN 2012-905X**

**Ayoon Optical**
Direct Importer & Wholesales
Dealers in optical Goods,
Frames, Lenses, Sunglass,
Tools, Etc
PRADA
LEVI'S
Ray-Ban
**No: 88, Market,**
**90/3, Prince Street**
**Colombo-11**
city vision
GUCCI
**Tel: 0112454346**
**Mobile: 0778787989**



## සංස්කාරකගෙන්

# පිළිගන්නට අවසරයි

මනස්කාන්ත වූ වටපිටාවක් සහිත අපගේ මාතෘ භූමිය වන ශ්‍රී ලංකාව තුළ බහු ආගමිකයන් සමඟ මුස්ලිම්වරුන් වන අප අන්‍යෝන්‍ය බැඳීමකින් ජීවත් වන්නෙමු. අල්ලාහ් දෙවිඳුන්ගේ උදව් ප්‍රකාරව රටේ සාමය හා සහජීවනය වෙනුවෙන් මෙම සඟරාව මහත් රුකුලක් වන්නේය.

මුස්ලිම්වරුන් අධික ලෙස දමිළ භාෂාව තම මව් බස කරගත් හෙයින් සිංහල භාෂාව මව් බස කරගත් අපේම සහෝදර ජනතාවට ඉස්ලාමයේ සැබෑ ස්වරූපය නිසියාකාරව නොලැබුණු බවට නම් සැබැවිය. එපමණක් නොව සිංහල භාෂාව පමණක් දන්නා මුස්ලිම්වරුන්ටත් මෙම තත්ත්වය දෙවැනි නොවේ. මුස්ලිම්වරුන් අවුරුදු 1000කට අධික කාලයක ඉතිහාසයක් සහිතව ලංකාව තුළ ජීවත් වුවත් මොවුන් ශ්‍රී ලංකාවේ මව් භාෂාව දැන ගැනීම සම්බන්ධයෙන් ප්‍රතිශතාත්මක අඩුතත්ත්වයෙන් පැවතීම වේදනා සහගතය. මුස්ලිම්වරුන් විසින් සිංහල භාෂාවෙන් මුද්‍රිත මාධ්‍ය ගෙන ගියද සිංහල භාෂාවට අප කළ යුතු මෙහෙවර තවමත් නිමා වී නොමැත.

**ඇරයුම** නමින් ප්‍රකාශයට පත් කරන මෙම සඟරාව සිංහල භාෂාවට මුස්ලිම්වරුන් විසින් කරන කුඩාම කුඩා මෙහෙවරක් ලෙස අප සිතන්නෙමු. එපමණක් නොව සිංහල භාෂාවෙන් ඉස්ලාමය දැන ගන්නට කැමැත්තෙන් සිටින්නන්ටද මෙය වඩා ප්‍රයෝජනවත් වනු ඇත.

ඉස්ලාම් දහමේ සැබෑ ස්වරූපය අන්‍ය ආගමික සහෝදර සහෝදරියන් අවබෝධ කරගත්තේ නම් ආගම් අතර අන්‍යෝන්‍ය බැඳීම තවතවත් වර්ධනය වනවා නියතය. අද ලෝකයේ මෙන්ම අප රටේ සුළු පිරිසක් ද ඉස්ලාමය සම්බන්ධයෙන් දුරුමත ව්‍යාප්ත කරමින් සිටියි. ඉස්ලාමයේ සැබෑ ස්වරූපය සිංහල භාෂාව හසුරුවන්නන් හට නොලැබුණු හෙයින්, දුරුමත ව්‍යාප්ත කරන්නන්ගේ අදහස් අපේම බුද්ධිමත් සහෝදර ජනතාව ඔවුන්ගේ දුර්මත සැබෑ ඉස්ලාමය යැයි අවබෝධ කර ගනිද්දෝ යි ගැටළුවක් අපසතුව පවතින්නේය. එමගින් රට තුළ සාමය සහජීවනය රටේ අභිවෘද්ධිය කඩවීමේ අවස්ථාව වළක්වාලීමට මෙම සඟරාව මගින් අල්ලාහ් දෙවිඳුන්ගේ උදව් ප්‍රකාර සුළු වශයෙන් හෝ කරන්නට හැකි වේ යැයි අප විශ්වාස කරන්නෙමු.

අපගේ මෙම කර්තව්‍යය සාර්ථක වීමට ඔබ සියලු දෙනාගේ සහයෝගය පතන්නෙමු..

## නබි වදන් වලින් ස්වල්පයක්..

### අසල්වැසියාගේ අයිතීන්

*කවරෙකුගේ හිරිහැරෙන් අසල්වැසියා නොමිදුනේ ද ඔහු ස්වර්ගයට ඇතුල් නොවේ.

*අල්ලාහ් හා පරාමාන්ත දිනය ගැන විශ්වාස කරන්නෙකු අසල් වැසියාට හිරිහැර නොකළ යුතුයි. අල්ලාහ් සහ පරමාන්ත දිනය විශ්වාස කරන්නෙකු හොඳ දෙයක්ම කථා කළ යුතුය. නැත්නම් නිහඩව සිටිය යුතුය.

*අල්ලාහ් ඉදිරියේ, මිතුරන් අතරින් යහපත් වන්නේ ඔවුනතර තම මිතුරාට යහපත්ව සිටින්නාය. තවද අල්ලාහ් ඉදිරියේ, අසල්වැසියන් අතුරින් යහපත් වන්නේ තම අසල්වැසියාට යහපත්ව සිටින්නාය. (ග්‍රන්ථ:බුහාරි - මුස්ලිම්)

### ප්‍රිය වචන හා සිනා මුසු මුහුණ

*ප්‍රිය වචනය ද දානයකි.

*යහපත් ක්‍රියා වලින් කිසිවක් සුළුකොට නොසිතන්න. නුඹේ සහෝදරයාව සිනා මුහුණෙන් හමුවීම වුවත් කමක් නැත.

*(විශ්වාසවන්තයිනි) අපායට බිය වන්න. රට ඉඳි ගෙඩියක කීතුවක් හෝ (දන්දීම) තුළින් වුවද කමක් නැත. එයත් නොමැති නම්, ප්‍රිය වචන කතා කිරීමෙන් (හෝ අපායෙන් ආරක්ෂාව පතන්න) යැයි අල්ලාහ් අවසන් ශාස්තෘවරයාණන් වන මුහම්මද් නබි තුමාණෝ ප්‍රකාශ කළහ. (ග්‍රන්ථ: බුහාරි - මුස්ලිම්)

**ඇරයුම** සඟරාවේ ඉදිරි ගමන සාර්ථක වීමට පාඨක අප සැම ප්‍රාර්ථනා කරමු.

**wellwisher**

# මතට තිත තියමු

අද බොහෝ දෙනා මතට තිත තියන්නට උත්සහ දරති. මේ සඳහා බොහෝ සංවිධාන හා ආයතන නොයෙක් අයුරින් ක්‍රියා කරමින් සිටියි. පුවත්පත් දැන්වීම් ඔස්සේ රූපවාහින් නාලිකා ඔස්සේ ගුවන් විදුලිය ඔස්සේ මෙහි ඇති ප්‍රතිවිපාකය සම්බන්ධයෙනී දැනුවත් කරමින් සිටියි. එහෙත් මේ දේවල් මතට තිත තියන්නට සමත් වුයේ නැත. මත හේතුවෙන් ලංකාවේ සංස්කෘතිය විනාශ වන්නේ ය. සාරධර්ම විනාශ වන්නේය. තරුණ තරුණියන් රැසක් බටහිර වාදීන් බවට පත්වෙමින් සිටින්නේය. අනුන් තමන්ව පිළිගත යුතු යන්න පටු චේතනාවෙන් ඇතැමුන් මතට ඇබ්බැහි වී සිටිති. ශෝචනීය කරුණක් නම් බොහෝ උත්සව වල මඟුල් ගෙවල් වල මරණ ගෙවල් මෙන්ම ආගමික උත්සව වල පවා රජ කරන්නේ අරක්කු බෝතල්ය. විශේෂයෙන් දෙසැම්බර් මාසයේ සිට ජනවාරි අග දක්වා අරක්කු සැපයීම සීග්‍ර වන්නේය. මතට තිත තියෙන දේ කෙසේවෙතත් එය සුළු වශයෙන් හෝ අඩු වීමක් ද දක්නට නොලැබෙන්නේය. ලෝකයේ පවතින සියලුම ආගම් මත තහනම් කරන්නේය. එදිනෙදා එයට විරුද්ධ දේශනයන් ද පවත්වන්නේය. එහෙත් ඇතැම් පිරිස් එය තුට්ටුවට වත් ගණන් ගන්නේ නැත. වයින් ස්ටෝර්ස් අබියස විනීතව පෝලිම් ගැසී අරක්කු මිලදී ගන්නනන්ව අපට එදිනෙදා පහසුවෙන් දැකගන්නට හැකිවේ. මෙය දකිනවිට පුජකයන් කරන දේශනාවෙන් කිසිදු ප්‍රයෝජනයක් නැති බව හැඟේ.

මතට දැඩිලෙස අදරය කළ ජනයින් පිරිසක් ලෝකයේ ජීවත් වූ බව ඉතිහාසයේ සඳහන්වේ. එහෙත් ඔවුන්ට මතයේ තිබෙන බැරෑරුම් කම පෙන්වා දුන් පසු සමස්ථයක් වශයෙන් එය ප්‍රතික්ෂේප කළේය. මෙය ඔබට ආශ්චර්‍යය ගෙන දෙන කරුණක් වනු නියතය. ආශ්චර්‍යය විය යුතු කරුණක් නොවේ එය අද තිබෙන සවුදි අරාබියාවයි. මේ සම්බන්ධයෙන් බොහෝ ඉතිහාසඥයන් පවසා තිබේ.

අල්ලාහ් දෙවිදුන්ගේ අවසන් ශාස්තෘවරයාණන් වන මුහම්මද් නබි තුමා මතට තිත තියන්නට බොහෝ සේ ක්‍රියා කළහ. මේ සම්බන්ධයෙන් අධික ලෙස දේශනා පැවැත් වුයේය. අල්ලාහ් දෙවිදුන්ගේ අනාවරණයන් එම ජනතාවට සත්‍යය ලෙසින්ම පහදා දී සමස්ථයක් වශයෙන් එම ජනතාව අතර මතට තිත තැබුවේය. ඒ මොහොතේම මත උපදවන සෑම දෙයක් පොළොවට මුදා හැරියේය. එය මහ ගංගාවක් ගලායන ආකරයෙන් තිබු බවද ඇතැම් ඉතිහාසඥයින් උපමා කරන්නේය.

ඉස්ලාම් දහම මත්ද්‍රව්‍යය සම්පුර්ණයෙන් තහනම් කරන්නේය. එහි සැපයුම් මාර්ගයද මුළුමනින්ම වසා දැමුවේය. නොයෙක් නීති දැමීමෙන් පමණක් මතට තිත තියන්නට නොහැක. එසේම තෝරාගත් දවසකට පමණක් මත් සැල් වසා දැමීමෙන් ප්‍රතිඵලයක් අත් නොවේ. ඉස්ලාමයේ දෙන උපදෙස් පිළිපැදුවේ නම් මෙය සමස්ථයක් වශයෙන් දුරුකරන්නට පුළුවන.

* මත නිෂ්පාදනය හා ආනයන අපනයන සහ බෙදා හැරීම තහනම් කළ යුතුයි.
* විකුණුම් බලපත්‍ර සමස්ථයක් වශයෙන් නිකුත් නොකිරීම.
* මත භාවිතා කරන්නන්ට නිසි දඩුවම් ලබා දීම.
* නිවනට හා ස්වර්ග රාජ්‍යයට ලඟා වීමේ හැකියා මත භාවිතයෙන් ගිලිහෙන බවට සෑම මිනිස් හදවත් තුළ කාවැද්දීම සඳහා ක්‍රියා කිරීම.

**උත්සහ කරමු. දියුණු වෙමු. මතෙන් තොර සමාජයක් බිහි කරමු. එය තුළින් යහපත් රටක් ගොඩ නගමු. ඉන්ෂා අල්ලාහ්!**

අබු සහරා

# අල්ලාහ්' යැයි හඳුන්වන්නේ කාටද ?

**මෙම** වචනය අදට ලෝකයේ නොදන්නා කෙනෙකු නොවන තරම්ය. එහෙත් මෙහි වචනාර්ථය නිසි අයුරින් දැන සිටින්නේ කෝටි දෙසීයක ජනතාවක් පමණී. එම කෝටි දෙසීයක ජනතාව තමන්ගේ අවශ්‍යතාවයන් සඳහා අත දිගු කරන්නේ උන්වහන්සේගෙන්ය. "උන්වහන්සෙයි සෑම දෙයක්ම ලබා දෙන්නේ උන්වහන්සේයි සෑමදෙයක්ම ලබා ගන්නේ" යැයි ඔවුන් තරයේ විශ්වාස කරති. තමන්ගේ ජීවිතයේ සෑම දෙයක්ම උන්වහන්සේට පවරා දී ඔවුන් සුවසේ පොළොවේ දිවි ගෙවති. මෙතරම් සුවිශාල බරක් උන්වහන්සේට පවරා සිටින මෙම ජනතාව කවදාකවත් උන්වහන්සේව ඇස් දෙකෙන් දැක නැත. ඇස් දෙකෙන් නොදකින ලද එම බලවේගයට සියවස් ගණනාවක් තිස්සේ වැඳුම් පිදුම් කරති. නොදකින ලද එම බලවේගය හදුනා ගනිමින් පැයෙන් පැයට අලුතෙන් පිරිස් එම ජනතාව අතරට ඇදී එති.

ඇත්තටම **අල්ලාහ්** කියන්නේ කවුද? කාන්තාවකගේ ගර්භාෂයෙන් උපන් මිනිසෙක්ද? අප අතරම ජීවත් වී මරණයට පත්වූ කෙනෙක් ද? මිනිසුන්ගේ අවශ්‍යතාවයට සමාන දෙයක් උන්වහන්සේ සතුව තිබෙන්නේ ද? එසේත් නැත්නම් මෙයටත් වඩා ඔබ්බට ගිය වෙනස් වූ නිර්වචනයක් සහිත ගුප්ත බලවේගයක් ද? අප දැන් විමසා බලමු.

ඔබට **අල්ලාහ්** ව හඳුනා ගැනීමට අවශ්‍ය නම් අප කියන දේ විශ්වාස නොකර ඔබම අහස දිහා පැය භාගයක් හැමදාම බලන්න. එතකොට හොඳට තේරේවී මේවා ඉබේ අපු දෙයක් ද එසේ නැත්නම් කවුරු හරි මවපු දෙයක්ද කියලා. මොකක් හරි බිහිවෙන්නට ඕනෙ නම් ඒක බිහි කරන්නට අවශ්‍ය මුල ද්‍රව්‍යය අවශ්‍යයි. එම මුල ද්‍රව්‍යය බිහිවීමට තවත් කුමක් හෝ මුල ද්‍රව්‍ය අවශ්‍යයි. මේ වගේ හොයා ගෙන ගියොත් අවසානයේදී එම මුලද්‍රව්‍යය නිෂ්පාදය කරපු නිෂ්පාදකයෙක් සිටිය යුතුයි. මෙහෙම හොයා ගෙන ගියොත් මේ ලොකයේ සෑම දෙයක්ම බිහි වීමට නිෂ්පාදකයෙක් අවශ්‍ය වන බව බුද්ධිමත් මිනිසාගේ නුවණට අවබෝධවෙයි. තේරුණේ නැත්නම් තවත් දෙයක් කියන්නම්.

කව්රු හරි මේසයක් සහ පුටුවක් පෙන්නල කියනවා මේක ඉබේම තමන්ගේ අතට පත් වුනා කියලා. බුද්ධිමත් මෙම ලිපිය කියවන ඔබනම් අනිවාර්‍යයෙන්ම මේ දේ විශ්වාස කරන්නේ නැහැ නේද? ඒ වගේම තමයි කව්රුහෝ කෙනෙකු කියනවා මේ විශ්වය මහා පිපිරීමකින් ඉබේම බිහිවුනා කියලා නැවතත් බුද්ධිමත් ඔබ හිතන්න ඕනේ එම මහා පිපිරීම ඇති කළේ කවුද කියලා. ඒ වගේම තවත් දෙයක් ඔබ හිතන්න ඕනේ එම පිපිරීමට අවශ්‍ය වූ වස්තූන් බිහි කළේ කවුද කියලා. එවිට ඔබට අවබෝධ වෙයි මේ කව්රුහෝ කෙනෙකු කරන්න ඕනේ කියලා. හැබැයි මේ දේ මිනිසුන් හා සමානව ජීවත් වූ සාමාන්‍ය පුද්ගලයකුට නම් කරන්නට බැහැ යනුවෙන් ද ඔබ අවබෝධ කළ යුතුයි. ඒවගේම මේක ලස්සනට හැඩගස්වා අප සතුටින් ජීවත් වීමට සලස්වල දුන්නු එම විශිෂ්ට වූ බලවේගය අනිවාර්‍යයෙන්ම එකක් වෙන්න ඕනේ. තුන් හතර දෙනෙක් එක්වෙලා නිෂ්පාදනය කරන්නට ගියොත් මේක පාලනය කිරීමේ දී බොහෝ ගැටළු ඇති වෙන්නට පුළුවන්. එක බල වේගයක් කියයි ඉර පහට උදාවෙන්න ඕනේ කියලා. තවත් කෙනෙක් කියයි නෑ නෑ හතට උදාවෙන්න ඕනේ කියලා. අපට තාත්තලා දෙන්නෙක් හිටියොත් කොච්චර අසාධාරණ ද, රටකට ජනාධිපති දෙන්නෙක් හිටියොත් කොච්චර ප්‍රශ්න ද, ඒ වගේම තමයි මේ විශ්වය මවා පාලනය කරන්නට දෙන්නෙක් හිටියොත් එක මහා විනාශයකට තුඩු දෙයි.

මේ දේවල් මම කලින්ම විස්තර කර දුන්නේ **අල්ලාහ්** කියන වචනයට හරියාකාර නිර්වචනයක් ලබා දෙන්නටයි. මිනිසාට ගෝචර නොවන බලවේගයක් තමන්ව පාලනය කරන බව මිනිසාගේ ශරීරය දන්නේය. ඒ නිසයි දෙවියෙක් නැහැයි කියන පුද්ගලයකු පවා තමන්ට විසඳාගත නොහැකි කරදරයක දී තමන් නොදැනුවත්වම අහස දිහා බලන්නේ. මේ තමන් නොදැනුවත්වම තමන්ව කව්දෝ පාලනය කරන බවට මෙය හොඳම නිදසුනයි. මේ දේ අවබෝධ කරගන්නට අපහසු නම් උන්වහනසේ ලබා දී තිබෙන ජයග්‍රහනය සඳහා වූ සිතියම් පොතක් තිබෙනවා. ඒකවත් සෝදිසි කරලා බලන්න. මිනිසාට ලියන්නට බැරි මිනිසාට සිතන්නට පවා නොහැකි දේ ඒකේ සඳහන්වෙලා තියෙනවද කියලා බලන්න.

අපි මෙලොවට බිහි වුණේ අපේ පාලනයකින් තොරවයි. ඒවගේම අපි මරණයට පත්වන්නේ ද අපේ පාලනයකින් තොරවයි. මේ විශ්වය ඉබේම බිහි වූ දෙයක් නොවේ. මෙය මවන ලද්දක් එසෙත් නැත්නම් නිෂ්පාදනය කරන ලද්දක්. මිනිසා ස්වර්ගය හා නිරයට යෑමේ දී තමන් කළ පව් පිං අවබෝධ කළ යුතුයි. ඒකටයි මේ පොළොවේ අපව මවා ඇත්තේ. මේලෝකේ ජීවත් වීමේදී සාධාරණයක් ඉටු නොවී මියගිය පුද්ගලයාට සාධරණයක් ඉටුවිය යුතුයි. මහා සයුර, ඇළ දොළ, කඳු ගංගා අදිය ගලා යන්නේ යම් කිසි පිළිවෙලකට. ඒ අපතේ යන දේවල් නෙවෙයි. මේවා සංවිධානය කළේ කවුද? ඉබේම මේස පුටු ඇතිවෙන්නේ නැත් නම් කොහොමද ප්‍රථවිය විතරක් ඉබේම කැරකෙන්නේ. මේවා කරන්නට විශිෂ්ට වූ බලයක් තිබිය යුතුයි. එම බලයට මිනිස් ගති පැවතුම් නොතිබිය යුතුයි. ආහාර පාන, යාන වාහන, නින්ද යනාදී දේ වලින් ඔබ්බට ගිය දෙයක් විය යුතුයි. ලිංග භේදයක් නොතිබිය යුතුයි. සමානකමක් නොතිබිය යුතුයි. එක වචන බහු වචන සමාන පද විරුද්ධ පද සන්ධි විසන්ධි යනා දේ එම බලවේගයට උච්චාරණය කරන නමට නොතිබිය යුතුයි. එම බලවේගයට යටත් සෑම කෙනෙකුම හැඳින් විය යුත්තේ එකම නමකින් පමණක්ය. එය නම් **අල්ලාහ්** ය. අල්ලාහ් යනු හුදෙක් සුළඟ, විදුලිය යන්නෙන් නම් අවබෝධ කරගන්නට එපා. අනිවාර්‍යයෙන් හැඩරුවක් තිබෙන්නට පුළුවන්. එහෙත් එය දකින්න අපගේ ඇස් දෙක ශක්තිවන්ත නැහැ. සුළඟ තියෙන බව අපි ඇස් දෙකෙන් දැක්කෙ නැහැ එහෙත් අපි විශ්වාස කරනවා. මුහුදේ වතුර ලීටර් කීයක් තියෙනව ද යන්න අපි හොයන්න යන්නේ නැහැ. සම්පූර්ණ අහස කිලෝමීටර් කීයක් ද කියලා හොයන්න යන්නේ නැහැ. මේවා හොයන්න ගියොත් වැරදෙන්නේ අපිටයි. ඒ වගේම අල්ලාහ්ව හොයාගෙන අහස උසට යන්නේ නැතිව උන්වහන්සේගේ බල මහිමය අබෝධ කරගෙන අල්ලාහ්ව අප විශ්වාස කරමු.

**අබූ**


Sunny Time

IMPORTERS & DEALERS IN WRIST WATCHES, WATCH PARTS, CLOCK AND ELECTRONICS ETC




93A, Keyzer Street, Colombo 11, Sri Lanka.
Tel: (+94)011 2542088 Mobile: (+94)0777 318438
E-mail: sunnytime@sltnet.lk



# ආගම ධර්මය ඔස්සේ ක්‍රෝධය වපුරන්නන් හට....

ආගම ධර්මය යනු මේලෝකයට කාලයෙන් කාලයට බිහි වු ශාස්තෲවරුන්ගෙන් ජනතාවට නිසි මග යෑම සඳහා ලබා දුන් මාර්ගෝපදේශයන් ය. එය අපට ලබා දුන් සෑම ශාස්තෲවරයෙකුම මෙලොව ජනයාට ඒ ආකරයෙන් ජීවත් වී ආදර්ශයක් ලබා දුන්නේය. උදාහරණ වශයෙන් බුදුරජාණන් වහන්සේ, ජේසුස් වහන්සේ, මුහම්මද් නබි තුමා අපට පෙන්වා දිය හැක. ඔවුන් ජීවත් වු ආකාරය අප ලියන්නට පටන් ගත්තේ නම් එය මහා කෘතියක් වනු ඇත. ශාස්තෲවරුන් ජීවත් වූ අවදියේම ඔවුන්ට යම් යම් බාධා තර්ජන නොතිබුණේ නැත. ඒවාට උන්වහන්සේලා පිළියම් යෙදුවේ සමස්ථ ජනයාටම පිළිගත හැකි ආකාරයනි. එම තීරණ වලට ජනයා ප්‍රකෝප වුයේ නැත. ඉත සිතින් එයට ආදරය කළහ. ඔවුන්ගෙන් පසු එම පණිවුඩය ලැබූ ජනයා එය ඒ ආකාරයෙන්ම ආරක්ෂා කර ඊළඟ පරම්පරාවට ලබා දුන්නේය. පණිවුඩය ලබා ගත් ඇතැම් පිරිස් තම තමන්ගේ අදහස් එහි මිශ්‍ර කර එහි පවිත්‍රතාවයට යම්තාක් දුරකට බලපෑමක් ඇති කළේය. මෙයට සංවිධානාත්මක පිරිස් සම්බන්ධ වූවා යැයි පැවසීමද නිවැරැදිය. තම තමන්ගේ න්‍යාය පත්‍රයන් ඔවුන් එයට ඇතුළු කළේය.

අද අප අතර තිබෙන ප්‍රචලිත ආගම් සියල්ලක්ම අවුරුදු දහස් ගණනක් පැරණිය. සෑම කෙනෙකුම ආගමක් අදහන්නේ නිවන් දකින්නට හෝ ස්වර්ග රාජ්‍යය තමන් අත් කරගැනීමටය. සෑම කෙනෙකුම සොයන්නේ තමන්ගේ ගැලවීම තිබෙන්නේ කොහිද යන්නයි. ඇතැම් ජනයා අද අසරණ වී සිටින්නේ තමන්ගේ නිවැරැදි මග සොයා ගැනීමේ අපහසු වෙනි. නිවැරැදි මග සොයා ගැනීමේ අයිතියක් ඔවුන් සතුව පවතින්නේය. ඔවුන්ට ඒ සඳහා නිදහස ඇත්තේය. එය සෑම ආගමක් ධර්මයක් අවධාරණය කරන්නේමය.

ආගම ධර්මය තුළින් මිනිසා සහජීවනයෙන් ජීවත්වනවා මිස ඒ ඔස්සේ වෛරය, ක්‍රෝධය, තන්හාව පතුරුවන්නේ නම් එය මිනිසාගේ පැවැත්මට හානිදායකය. එය තුළින් ලේ ගංගාවක් ගලා යෑමට ඉඩ ඇත්තේය. ආගම ධර්මය පවසන ආකාරයටම ජීවත් වුයේ නම් එය මේ සඳහා මග නොපෙන්වන්නේය. තම ශාස්තෲවරයා නොපෙන්වූ ආකාරයට ආගම ධර්මය හසුරුවන්නේ නම් අවසානය ඛේදජනක විය හැකිය.

සෑම දෙනෙකුම සත්‍යය සොයා ගමන් කළ යුතුය. එසේ නොමැතිව තමන්ගේ ඇතැම් පූජක වරුන් ආගම ධර්මය හොඳින් හදාරා සිටින්නන් යැයි පවසන උදවියගේ උසිගැන්වීම් වලට අප ලක්නොවිය යුතුය. ඇතැම් පිරිස් තවත් පිරිසගේ මුදල් වලට යටත් වී තම මඩිය තර කර ගැනීම සඳහා ආගම ධර්මය යොදාගන්නා බවක් අපට දක්නට ලැබෙන්නේය. මෙයට එරෙහිව යම් පූජක පක්ෂ නැගී සිටියත් උන්වහන්සේලාව කොන් කර ඈත් කර දැමීමක් ද සිදුවේ. අද අපට අවශ්‍ය වී තිබෙන්නේ වෛරය නොවේ. ක්‍රෝධය නොවේ. නිදහසේ ජීවත් වීමට අවශ්‍ය පරිසරයයි. ආගම ධර්මය තොරා බේරා ගැනීමේ අයිතිය එක් එක් පුද්ගයන් සතු දෙයකි. තම තමන්ගේ ආගම ධර්මය සත්‍යය කරා ගමන් කරවන්නේ නම් එය කවදා හෝ ජයගනු ඇත. එය සිතට ධාරණය නොකර අනවශ්‍ය ලෙස තර්කයක් සඳහා නොගැලපෙන කරුණු කාරනා කොහින්දෝ සොයාගෙන එක් එක් ආගම ධර්ම වලට මඩ ප්‍රචාරය ගෙන යාමෙන් සිදුවන්නේ නිවන හෝ ස්වර්ගය අපෙන් ඈත් වීමයි.

සෑම සමාජයකටම ඔබිනා ලෙස ධර්ම දේශනයන් පවත්වන ස්වාමීන් වහන්සේලා, පාදිරිවරුන් මෙන්ම මව්ලවි වරුන් අප රටේ ජීවත් වන්නේය.

ආගම් භේදයකින් තොරව උන්වහන්සේලාගේ ධර්ම දේශනයන් වලට ඇහුම්කන් දෙන උදවිය අද ලංකාවේ ජීවත් වන්නේය. ඔවුන්ගේ ධර්ම දේශනයන්ට සැවොම පාහේ සවන් දෙන්නේ ඔවුන් එක් එක් අයගේ කෙළම් කියමින් අඩුපාඩු හොයමින් ලැබුණු අවස්ථාවෙන් තමන්ගේ න්‍යාය පත්‍රය ලෝකයාට පැවසීමට උත්සහ නොගෙන නිසාය. එහි දී ශාස්තෘවරයාණන්ගේ උපදේශයන් සීයයට සීයයක් ප්‍රයෝජනයට ගනිමින් ජනයාව යහපත කරා ගෙනයන්නේය. මෙවැනි දෙයක් අද දකින්නට ලැබෙන්නේ සොච්චමක් යැයි අපට හැගේ. ඇතැම් පිරිස් ආගමේ අනෙකුත් ප්‍රධාන ප්‍රතිපත්ති අමතක කරවා එකම ප්‍රතිපත්තිය පමණක් උසුලාගෙන සිටින්න යැයි පවසනවාක් අපට දැනෙන්නේය. මෙයින් ඵලප්‍රයෝජන ගන්නේ ද ඔවුන්මය.

එකම ප්‍රතිපත්තිය පමණක් ආරක්ෂා කිරීමට ගොස් අනෙකුත් ප්‍රතිපත්ති අමතක කරගත හොත් ඉතිරි වූ ප්‍රතිපත්තීන් අපෙන් ගිලිහෙනවා නියතය. එවිට අපව වට්ටන්නට බලාපොරොත්තුවෙන් සිටින ඇතැම් බටහිර ඒජන්තයන්ට එය වාසිදායක වනු ඇත. ඔවුන් එම ප්‍රතිපත්තීන් විනාශ කිරීමටම වෙර දරන්නේය. එහි ප්‍රතිඵලය අද බොහෝ වාණිජමය තැන්වල හා ගම්පළාත් වල සැරිසරුවහොත් අපට දැක ගැනීමට පුළුවන. බොරු ප්‍රචාරය ගෙන යමින් අහිංසක ජනයාව මුලා කරමින් බොරු උපදේශනයන් පවසා ජනතාව තමන් වෙතට ඇදගන්නා ධර්ම ප්‍රචාරකයන් යැයි තමන්ට කියා ගන්නන් අවසානයේ බලාපොරොත්තු වන්නේ කුමක් ද යන්න අපට නොවැටහේ. අන්තර්ජාලය ඔස්සේ පුවත්පත් ඔස්සේ රූපවාහිනී නාලිකා ඔස්සේ කඹ ඇදීමක් කරන්නේ ජනතාව නිසිමග ගෙන යෑමටද? එසේ නොමැති නම් ජනයා භේදබින්න කිරීමට ද? ආගම් හා ධර්මයන් අතර ප්‍රශ්නයක් පවතින්නේ නම් එය සාකච්ඡාමය ස්වරූපයෙන් විසඳා ගැනීමට හැකි වන්නේය. මා කියවා ලබා ගත් දැනුම අනුව නම් බුදුරජාණන් වහන්සේ අනෙකුත් ආගම් පිළිපදින්නන්ට තමන්ගේ ධර්මය ප්‍රචාරය කළ බවක් කියැවේ. එහි දී උන්වහන්සේ ඔවුන්ගේ සිත් කම්පා කළේ නැත. මේ ආකාරයටම ජේසුස් වහන්සේ, මුහම්මද් නබි තුමා යන ආගමික ශාස්තෘවරුන් කළ බවද අපට දැනගත හැකිවේ.

ආගම හා ධර්මය අපට ලබා දුන් ඒ ශාස්තෘවරුන් අද ජීවත්ව සිටියේ නම් අද සිදුවන ධර්ම ප්‍රචාරය ගැන බලා විරුද්ධ වන්නේමය. අපගේ ආගම ධර්මය ආරක්ෂා කරගැනීමට අවශ්‍යය යැයි කව්රු හෝ කෙනෙකු අදහස් කරන්නේ නම් තමන්ගේ ශාස්තෘවරයා මගපෙන්වූ ආකාරයටම කිසිදු වෙනස් කිරීමකින් තොරව අපගේ මඩිය තරකර ගැනීමේ අදහස් එයට මිශ්‍ර නොකර නිසි ආකාරයට සීයයට සීයයක් නිවැරදිව ධර්මඋපදේශයන් ලබා දෙන්නේ නම් නියත වශයෙන්ම අප විශ්වාස කරන ආගම ධර්මය රැකෙනු ඇත. එවිට, කෙනෙකු තවත් කෙනෙකුට කරන මඩ ප්‍රචාරයන් අවශ්‍ය නොවන්නේය. මෙය සමස්ථ ජනයා අවබෝධ කරගත්තේ නම් මිනිසා කියන සත්වයාට සුවසේ ජීවත් වීමට හැකි වන්නේය.

**කුර්ෂිඩ් අහමඩ්**
**කොළඹ**

# මුස්ලිම්වරුන්ගේ දැක්මෙන් ශාස්තෘවරයා-වක්තෘවරයා-පණිවිඩකරු

අල්ලාහ්ට පමණක් වන්දනාමානය කිරීම කෙරෙහි මානව සංහතිය කැඳවීම හා එයට විරුද්ධව පවතින සෑම දෙයක්ම ඉවත් කිරීම සඳහා රසූල් හෙවත් නබිවරුන් (ශාස්තෘවරයා-වක්තෘවරයා-පණිවිඩකරු) එවූ බව මුස්ලිම්වරුන් විශ්වාස කරති. ඔවුන්ව මවන ලද්දේ ද අල්ලාහ් විසිනි. ඔවුන් ද සාමාන්‍ය මිනිසුන්ය. ඔවුන්ට මවා පාලනය කරන බලය හෝ වන්දනාමානයට අදාල බල මහිමය හෝ නොවන අතර ආහාර පානය කිරීම, ලෙඩවීම හා මරණයට ලක්වීම යනා දී මිනිස් අවශ්‍යතාවන් ඇත්තේය.

රසූල්වරුන් හෙවත් නබිවරුන් මිනිසුන් අතර ශ්‍රේෂ්ඨ පුද්ගලයන් වන අතර අල්ලාහ් ඔවුන්ව තෝරාගෙන රසූල් හෙවත් නබිත්වය පිරිනමා (බුදු වීම) ශ්‍රේෂ්ඨ කළේය. එතුමන්ලාගේ නබිත්වය සත්‍ය කිරීම මගින් ඔවුන් විශ්වාස කළ යුතු අතර ඔවුන්ගේ නම් වශයෙන් දන්නා පිරිසද විශ්වාස කළ යුතුය. තවද එතුමන්ලා ප්‍රචාරය කළ කරුණු සියල්ල විශ්වාස කළ යුතු අතර ඔවුන්ගෙන් අවසාන වන්තයා වූ මුහම්මද් නබි තුමාව තරයේ විශ්වාස කර එතුමන් ලබාදුන් පණිවිඩය හැර වෙනකක් තමන්ගේ ජීවන මාර්ගය තොරා නොගත යුතුය.

**උත්තරීතර අල්ලාහ් ප්‍රකාශ කරයි: (විශ්වාසවන්තයිනි) යහපත් දෑ වෙත (ජනයාට) ආරාධනා කර හොඳ දෑ අණ කර නරක දෙයින් වළක්වාලන පිරිසක් ඔබ අතර සිටිය යුතුය. ජය ලබන්නෝ ඔවුහුමය. (ආලු ඉම්රාන් : 104)**

* රැකියාවට ගොස් එසේත් නැත්නම් ගමනක් ගොස් ආපසු නිවසට පැමිණ ගෙට ඇතුල් වනවිට සිනාමුසු මුහුණින් ඇතුළු වන්න.

* යහපත් වචන තෝරා කථා කරන්න. වාද විවාද වලින් වළකින්න.

* ඇය කථා කරන විට එයට ඕනෑ කමින් සවන් දෙන්න.

* පැහැදිලි වචන භාවිතයෙන් කතා කරන්න. බිරිඳට ඔබ පවසන දේ වැටහුණේ නැති බවක් දැණුන හොත් නැවතත් එය පැහැදිලි කරන්න.

* බිරිඳට සුරතල් සහ කන්කළු නම්වලින් ආමන්ත්‍රණය කරන්න.

* බිරිඳ වෙනුවෙන් වේලාව වෙන් කරන්න.

* සෑම හොඳ දෙයක්ම ඈ සමඟ බෙදා ගන්න.

* ඔබලාගේ මිහිරි අතීතය දෙදෙනා හුදෙකලාවන විට සිහි කරන්න.

## ජීවිතයට උපදෙසක්........

පොළිය ගිළගැනීම නිසා පොළිගත්තවුන් තුළ තණ්හාව, අන්සතු දය හි කෑදරකම, මසුරුකම හා ආත්මාර්ථකාමිත්වය හටගන්නේය. පොළි ගෙවන්නවුන් තුළ වෛරය, ක්‍රෝධය, සතුරුබව හා ඊර්ෂියාව ඇති වන්නේය. මෙම පාපයන් මහ පොළොවේ නොසන්සුන්තාවයට ද හේතුවන්නේය. එබැවින් පොළියට දීම හා ගැනීම සම්බන්ධ සියලු දේ වලින් ඈත් වී දනට පිනට දීම ක්‍රියාත්මක කරන්න. දනට පිනට දෙමින් නොමසුරුව මුදල් වැය කරන අයටම ස්වර්ගය නියමිතව ඇත. පොළියට සම්බන්ධ කිසිවෙකුට ස්වර්ගයේ දොර විවර නොවන බව මතක තබා ගන්න.

# බිරිඳගෙන් උපදෙස් කිහිපයක්

* ඇය දුකෙන් සිටින්නේ නම් හාස්‍ය මුසු වූ දේ කතා කරමින් ඇයගේ දුක අමතක කරවන්න.

* නිවසේ වැඩ වලදී ඇයට උදව් කරන්න.

* ඔබට අසීරු අවස්ථාවක ඇය උදව් කළේ නම් ඇයට ස්තුති කර ප්‍රශංසා කරන්න.

* පවුලේ කටයුතු සම්බන්ධයෙන් ඇය සමඟ සාකච්ඡා කරන්න.

* ඇයට අදහස් යෝජනා චෝදනා ඉදිරිපත් කරන්න අවස්ථාවක් දෙන්න.

* සෑම විටම ඔබ පිරිසිදු ප්‍රසන්න පෙනුමකින් සිටින්න.

* ඔබගේ බිරිඳව තවත් කෙනෙකු රසවිඳන ආකාරයට නොඅන්දවන්න.

* ඔබ නැති අවස්ථාක ලේ නෑයන් සමඟ පමණක් එළියට යෑමට අවසර දෙන්න.

* දෙදෙනා අතර අදහස් හුවමාරු කිරීමේ දී යම් ගැටුළුවක් ඇති වුවහොත් එය ඉක්මණින් අමතක කරගන්න.

* ඇයට අවමානයක් ඇතිවන ආකාරයට නොහැසිරෙන්න.

* කරුණාවෙන් හා සන්සුන් ආකාරයෙන් වැරදි පෙන්වා දෙන්න.

* ලොකු වැරදි පමණක් සැළකිල්ලට ගන්න.

* සුළු වැරදි සඳහා සමාව දෙන්න.

* රෑ වෙන්නට කළින් ගෙදර එන්න.

* ඇයගේ වියදමට මුදල් ලබා දෙන්න.

* සවස් වරුවේ ඇයට කැමති ආහාරයක් රැගෙන යන්න.

* ආගම ධර්මය ගැන හොඳ පැහැදීමක් ලබාදෙන්න.

* සැමියා බිරිඳ සතුටින් සිටින විට බිරිඳ මිය ගියේ නම් ඇය ස්වර්ගය ඇතුළුවන බවට ඉස්ලාමයේ සඳහන් වී තිබෙන කරුණ ඇයට නිතර නිතර මතක් කරන්න.






පසු ගිය මාසයක ඇහැළියගොඩ ප්‍රාදේශයේ පැවැති උත්සවයක ආගමික හා සංස්කෘතික අධ්‍යයන සංසදයෙන් ඉස්ලාම් දහම සම්බන්ධයෙන් මුස්ලිම් නොවන සහෝදරයින්ට ඇති ගැටළු සම්බන්ධයෙන් වූ ප්‍රශ්නෝත්ර සැසිවාරයක් සංවිධානය කෙරුණි. මෙහිදී රජයේ ප්‍රබල ඇමතිවරුන් සහභාගි වූ අයුරු සහ මුස්ලිම් නොවන සහෝදරයකුගේ ප්‍රශ්නයකට පිළිතුරු දෙන ආකාරයද ඡායා රූපයේ දැක්වේ.










**අපගේ ආයතනයෙන් ප්‍රකාශයට පත් කරන ලද කෘති වලින් කොටසක් ඉහත දැක්වේ. සෞරග්‍රහ මණ්ඩලය ජයගත් මිනිසා තමන්ගේ විචාර බුද්ධිය තම ජීවිතය සඳහා යොදා ගන්නා ආකාරය පැහැදිලි කරමින් විචාර බුද්ධියට සිදු වූයේ කුමක් ද? යන්න පළමු කෘතියත් ඉස්ලාමයට අනුව මිනිසාගේ බිහිවීම සිදුවී ඇති ආකාරය පැහැදිලි කරමින් පරිණාමවාදය පිළිබද ඉස්ලාමීය දැක්ම යන කෘතියත් මිනිසා නිතරම තම මැවුම් කරුවා සිහි කළ යුතුයි යන්න පරම චේතනාවෙන් ප්‍රාර්ථනා සම්භාරය යන කෘතියත් ඔබ අතට පත් කරන්නෙමු. ආගම් අතර අන්‍යෝන්‍ය සම්බන්ධකම් ඇති කර ගැනීම සඳහා මෙම කෘතියින් මහත් උපයෝගී වනු ඇතැයි අප විශ්වාස කරන්නෙමු. ඔබට ළඟම ඇති පුස්තකාලයකට හෝ පාසලකට මෙම කෘති අවශ්‍ය වන්නේ නම් අපහා සම්බන්ධ වන්න. ඉස්ලාම් දහම සම්බන්ධයෙන් වැරදී මත දුරුලීම සඳහා වූ ලංකාවේ පුරෝගාමී ආයතනයක් වන අපත් සමඟ දිගටම සම්බන්ධ වී සිටින්න.**

مجلة إسلامية باللغة السنهالية تصدر عن جمعية الدراسات الدينية والثقافية وتهدف إزالة سوء

التفاهم حول الإسلام بين المسلمين وغيرهم في ضوء مقاصد الشريعة الإسلامية.